

Sasintha madushan
(Bsc(Hons)
0712470326

# Chemical Equilibrium

## අයනික සමතුලිතතාවය

### අම්ල-භස්ම අයනික සමතුලිතතාවය



**සිද්ධාන්ත පුනරීක්ෂණය**

1) දුබල අම්ලයක අයනීකරණ/විඝටන නියතය ($K_a$) හඳුන්වන්න.
2) දුබල භස්මයක අයනීකරණ/විඝටන නියතය ($K_b$) හඳුන්වන්න.
3) ජලයේ අයනීකරණය හා ජලයේ අයනීකරණ නියතය ($K_w$) හඳුන්වන්න.
4) සංයුග්මක අම්ල-භස්ම යුගලවල $K_a$ හා $K_b$ අතර සම්බන්ධතාව ව්‍යුත්පන්න කරන්න.
5) ඔස්වල්ඩ් ගේ තනුකරණ නියමය ලියන්න.
6) $p^H$ අගය හඳුන්වන්න.
7) ස්වාරක්ෂක ද්‍රාවණ හඳුන්වන්න.
8) ස්වාරක්ෂක පද්ධති හා ස්වාරක්ෂක ක්‍රියාව පහදන්න
9) ද්‍රාවණ වල $p^H$ ගණනය කිරීම

**ප්‍රබල අම්ල ද්‍රාවණවල $p^H$ ගණනය කිරීම**

I. 25 $^0C$ දී පහත සාන්ද්‍රන සහිත HCl ද්‍රාවනවල $p^H$ අගය හා $OH^-$ අයන සාන්ද්‍රනය සොයන්න
   a. 0.01 mol $dm^{-3}$
   b. 1 x $10^{-6}$ mol $dm^{-3}$
   c. 1 x $10^{-8}$ mol $dm^{-3}$

**ප්‍රබල භස්ම ද්‍රාවණවල $p^H$ ගණනය කිරීම**

I. 25 $^0C$ දී පහත සාන්ද්‍රන සහිත NaOH ද්‍රාවනවල $p^H$ අගය හා $H_3O^+$ අයන සාන්ද්‍රනය සොයන්න
   a. 0.01 mol $dm^{-3}$
   b. 1 x $10^{-6}$ mol $dm^{-3}$
   c. 1 x $10^{-9}$ mol $dm^{-3}$

**දුබල අම්ල ද්‍රාවණවල $p^H$ ගණනය කිරීම**

I. 25 $^0C$ දී 1.25 x $10^{-2}$ mol $dm^{-3}$ සාන්ද්‍රන සහිත HOCl ද්‍රාවණයක $p^H$ අගය හා $OH^-$ අයන සාන්ද්‍රනය සොයන්න. 25$^0C$ දී HOCl හි $k_a$ = 3.2 x $10^{-4}$ mol $dm^{-3}$.

**දුබල අම්ල හා ප්‍රබල භස්මවලින් ව්‍යුත්පන්න ලවණ ද්‍රාවණවල $p^H$ ගණනය කිරීම**

I. 0.050 mol $dm^{-3}$ සෝඩියම් එතනොඒට් ද්‍රාවණයක හයිඩ්‍රොක්සයිඩ් අයන සාන්ද්‍රණය හා ප්‍රතික්‍රියා ප්‍රතිශතය ගණනය කරන්න. අදාළ උෂ්ණත්වයේ දී එතනොයික් අම්ලයේ $K_a$ , 1.8 ×$10^{-5}$ mol $dm^{-3}$ වේ.

**දුබල හස්මයකින් හා ප්‍රබල අම්ලයකින් ව්‍යුත්පන්න ලවණ ද්‍රාවණවල pH ගණනය කිරීම**

I. 0.010 mol $dm^{-3}$ $NH_4Cl$ ද්‍රාවණයක සියලුම අයන සාන්ද්‍රණ ගණනය කරන්න. අදාළ උෂ්ණත්වයේ දී $NH_3$ $K_b$ , 1.8 ×$10^{-5}$ mol $dm^{-3}$ වේ.

1) එක්තරා උෂ්ණත්වයකදී $CH_3COOH$ අම්ලයේ $p^{ka}$ = 4.80 ක් වන අතර මෙම උෂ්ණත්වයේ පවතින ද්‍රාවණයක $CH_3COOH$ yd $CH_3COONa$ , පිළිවෙලින් 0.50 mol $dm^{-3}$ හා 0.25 mol $dm^{-3}$ යන සාන්ද්‍රණ වලින් අඩංගු වේ. මෙම ද්‍රාවණයෙන් 100 $cm^3$ කට සාන්ද්‍රණය 0.10 mol $dm^{-3}$ වන NaOH ද්‍රාවණ 1.0 $cm^3$ එක් කළ පසු ලැබෙන අවසාන ද්‍රාවණයේ pH අගය කොපමණද?

2) $25^0C$ දී සාන්ද්‍රණය 0.10 mol $dm^{-3}$ වන $H_2S$ ජලීය ද්‍රාවණයක $H_2S$ ආංශික විඝටනයෙන් ඇති වන $S^{2-}$ අයන සාන්ද්‍රණය කොපමණ දැයි ගණනය කරන්න. $25^0C$ දී $H_2S$ සඳහා $k_{a1}$ = 1.1 x $10^{-7}$ mol $dm^{-3}$ , $k_{a2}$ = 1.0 x $10^{-14}$ mol $dm^{-3}$ .

3) $25^0C$ දී HA නම් දුබල අම්ලයේ විඝටන නියතය 4 x $10^{-9}$ mol $dm^{-3}$ වේ. එම උෂ්ණත්වයේම පවතින සාන්ද්‍රණය 0.1 mol $dm^{-3}$ වන NaA ද්‍රාවණයක $OH^-$ අයන සාන්ද්‍රණය කොපමණ දැයි ගණනය කරන්න. $25^0C$ දී ජලයේ $k_w$ = 1.0 x $10^{-14}$ $mol^2$ $dm^{-6}$

4) 0.01 mol $dm^{-3}$ $Ba(OH)_2$ ද්‍රාවනයක 51 $cm^3$ කට 0.01 mol $dm^{-3}$ $HNO_3$ ද්‍රාවනයකින් 49 $cm^3$ ක් එක් කරයි. එකතු කිරිමේදි පරිමා වෙනසක් සිදු නොවේ නම් $25^0C$ දි ද්‍රාවණයෙ $p^H$ අගය සොයන්න

5) 25 $^0C$ දි 0.02 mol $dm^{-3}$ සාන්ද්‍රන සහිත HCl අම්ලය ද 1.5 mol $dm^{-3}$ සාන්ද්‍රන සහිත මෙතනොයික් අම්ලය ද ද්‍රාවණයක පවති ද්‍රාවණයේ pH අගය හා එතනොයික් අම්ලය විඝටන ප්‍රතිශතය ගණනය කරන්න. අදාළ උෂ්ණත්වයේ දී මෙතනොයික් අම්ලයේ $K_a$ , 2.14 ×$10^{-4}$ mol $dm^{-3}$ වේ.

6) 0.1 mol $dm^{-3}$ KOH ද්‍රාවණයක 10 $cm^3$ කට 0.1 mol $dm^{-3}$ $CH_3COOH$ ද්‍රාවනයකින් 40 $cm^3$ ක් එක් කරයි. එකතු කිරිමේදි පරිමා වෙනසක් සිදු නොවේ නම් $25^0C$ දි ද්‍රාවණයෙ $p^H$ අගය සොයන්න. 25 $^0C$ දි $CH_3COOH$ අම්ලයේ $K_a$ = 1.8 ×$10^{-5}$ mol $dm^{-3}$ වේ.

7) 0.01 mol $dm^{-3}$ HCl ද්‍රාවණයක 500 $cm^3$ කට $CH_3COONa$ 0.02 mol ක් එක් කරයි. එකතු කිරිමේදි පරිමා වෙනසක් සිදු නොවේ නම් $25^0C$ දි ද්‍රාවණයෙ $p^H$ අගය සොයන්න. 25 $^0C$ දි $CH_3COOH$ අම්ලයේ $K_a$ = 1.8 ×$10^{-5}$ mol $dm^{-3}$ වේ.

8) 25 $^0C$ දී HCOOH වලට සාපේක්ෂ සාන්ද්‍රණය 0.1 mol $dm^{-3}$ වන හා HOCN වලට සාපේක්ෂ සාන්ද්‍රණය 0.1 mol $dm^{-3}$ වන ද්‍රාවණයක $H_3O^+$, $HCOO^-$, $OCN^-$ අයන සාන්ද්‍රණ ගණනය කරන්න. 25 $^0C$ දී HCOOH අම්ලයේ $K_a = 1.8 \times 10^{-4}$ mol $dm^{-3}$ හා HOCN අම්ලයේ $K_a = 3.3 \times 10^{-4}$ mol $dm^{-3}$ වේ.

9) 25 $^0C$ දී $CH_3COOH$ වලට සාපේක්ෂ සාන්ද්‍රණය 0.1 mol $dm^{-3}$ වන හා HCN වලට සාපේක්ෂ සාන්ද්‍රණය 0.2 mol $dm^{-3}$ වන ද්‍රාවණයක $H_3O^+$, $CH_3COO^-$, $CN^-$ අයන සාන්ද්‍රණ ගණනය කරන්න. 25 $^0C$ දී $CH_3COOH$ අම්ලයේ $K_a = 1.75 \times 10^{-5}$ mol $dm^{-3}$ හා HCN අම්ලයේ $K_a = 6.2 \times 10^{-10}$ mol $dm^{-3}$ වේ.

10) 25 $^0C$ දී 0.01 mol $dm^{-3}$ සාන්ද්‍රන සහිත මෙතනොයික් අම්ලය ද්‍රාවණයක පවති. ද්‍රාවණයේ pH අගය 2.49 වේ. අදාළ උෂ්ණත්වයේ දී මෙතනොයික් අම්ලයේ $K_a$ ගණනය කරන්න.

11) 25 $^0C$ දී $(C_2H_5)_2NH$ 0.02 mol ක් එක් කර සදා ගත් 1 $dm^3$ ද්‍රාවණයේ pH අගය 11.82 වේ. අදාළ උෂ්ණත්වයේ දී $(C_2H_5)_2NH$ $K_b$ ගණනය කරන්න.

12) 25 $^0C$ දී 0.1 mol $dm^{-3}$ $NH_4OCN$ ද්‍රාවණයක $p^H$ අගය සොයන්න. 25 $^0C$ දී $NH_3$ $K_b = 1.75 \times 10^{-5}$ mol $dm^{-3}$ හා HOCN අම්ලයේ $K_a = 3.3 \times 10^{-4}$ mol $dm^{-3}$ වේ.

13) ජලීය ද්‍රාවන 1 $dm^3$ තුල $C_2H_5COOH$ 0.02 mol ක් තිබේ. pH අගය 4.75 ක් වූ ස්වාරක්ෂක ද්‍රාවණයක් ලබා ගැනීමට එක් කල යුතු $C_2H_5COONa$ ප්‍රමාණය සොයන්න.
එම ද්‍රාවනයට HCl 0.01 mol එක් කල විට ද්‍රාවණයේ $p^H$ අගය කවරේද
අදාළ උෂ්ණත්වයේ දී $C_2H_5COOH$ අම්ලයේ $K_a = 1.33 \times 10^{-5}$ mol $dm^{-3}$

14) 25 $^0C$ දී $CH_3COOH$ වලට සාපේක්ෂ සාන්ද්‍රණය 0.1 mol $dm^{-3}$ වන හා $CH_3COONa$ වලට සාපේක්ෂ සාන්ද්‍රණය 0.2 mol $dm^{-3}$ වන ද්‍රාවණයේ pH අගය 5.07 වේ. 25 $^0C$ දී ද්‍රාවණයේ 75 $cm^3$ ට 0.1 mol $dm^{-3}$ HCl 9.5 $cm^3$ එක් කල විට ද්‍රාවණයේ $p^H$ අගය සොයන්න.
$CH_3COOH$ අම්ලයේ $K_a = 1.8 \times 10^{-5}$ mol $dm^{-3}$


Chemistry 46